**‘ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලය, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ විදේශ ප්‍රතිපත්ති’ පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ විදේශ ප්‍රතිපත්ති සංසදය විසින් පවත්වන ලද සාකච්ඡාව.**

2024 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා දින ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ(LKI) Lighthouse ශ්‍රවණාගාරයේදී පවත්වන ලද, 4 වැනි විදේශ ප්‍රතිපත්ති සංසදයේදී, ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගතකරණයේ ප්‍රතිඵල, ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය හා විදේශ ප්‍රතිපත්ති කෙරෙහි එහි බලපෑම යන කරුණ ඉස්මතු කරන ලදී

මෙහිදී විශේෂයෙන්ම පාලනයේ වර්ධනය ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය ප්‍රයෝජනයට ගතහැකි විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය මෙන්ම තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා වන ක්‍රමවේදයන් පිළිබඳව සියලු දේශපාලන පක්ෂ අතර එකඟතාවයක් ඇතිකරගැනීමේ අවශ්‍යතාවය ද අවධාරණය කරන ලදී.

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ ප්‍රධානත්වයෙන් මාස හතරකට වරක් පවත්වනු ලබන, ‘විදේශ ප්‍රතිපත්ති සංසදය' සමකාලීන විදේශ ප්‍රතිපත්ති පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමත්, විදේශ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශ්‍රී ලංකාවට ඉදිරි දැක්මක් ඇතිකරගැනීමට අවශ්‍ය විශේෂඥයින් ඒකරාශී කරයි.

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ, තානාපති රවිනාථ ආර්යසිංහ විසින් මෙහෙයවන ලද මෙම සිව් පුද්ගල කණ්ඩයමට, Overseas Development Institute හී ජ්‍යෙෂ්ඨ බාහිර සාමාජිකයෙකු වන ආචාර්ය ගනේෂන් විග්නරාජා, ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති දුමින්ද හුලංගමුව, ලෝක ආර්ථික සංසදයේ විශේෂඥ සාමාජික සහ ආර්ථික විශේෂඥ තලාල් රාෆි, සහ වෙරිටේ රිසර්ච් හි පර්යේෂණ අධ්‍යක්ෂිකා සුභාෂිනී අබේසිංහ යන අය සහභාගී වූහ.

මෙහිදී, මෑතකාලීන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයේ ප්‍රතිවිපාක පිළිබඳ තක්සේරු කරමින් තානාපති රවිනාථ ආර්යසිංහ මහතා, ‘IMF ශ්‍රී ලංකා රෝග විනිශ්චය වාර්තාවේ’ යෝජිත යාන්ත්‍රණය සහ එහි නිර්දේශ, හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික රාජතාන්ත්‍රිකභාවය විසින් අත්විඳින ලද දිගුකාලීන අභියෝග ජය ගැනීමට උපකාරී විය හැකි අභ්‍යන්තර බාධක ප්‍රතිපත්ති සහ නියාමනයන්හී අනුකූලතාවයක් නොමැතිකම, විනිවිදභාවය නොමැතිකම සහ දූෂණ චෝදනා ආදිය පිළිබඳවත්, ශ්‍රී ලංකාවටද සම තත්ත්වයක් හිමිවීමේ අවශ්‍යතාවය, අපනයනයේදී අගය එකතු කළ නිෂ්පාදනවල ගුණාත්මක හා ප්‍රාණාත්මක වර්ධනයක් ඇතිකරගැනීමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ බාහිර හවුල්කරුවන් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීමට ද පෙළඹවිය යුතු බව කියා සිටි ඔහු, වෙළඳපොළ විවෘත කිරීම, ආධාර ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම, ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය සඳහා වන සංවිධානය (OECD) පනවා ඇති ප්‍රමිතීන් ලිහිල් කිරීම, ණය ශ්‍රේණිගත කිරීම් සහ අනෙකුත් දර්ශක මෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳ අහිතකර සංචාරක උපදේශන වැනි දෑ ලිහිල් කරගැනීමේ අවශ්‍යතාවය ද අවධාරණය කළේය.

Overseas Development Institute (ODI) ජ්‍යෙෂ්ඨ බාහිර සම්පත්ධාරියකු වන ආචාර්ය ගනේෂන් විග්නරාජා, ලෝකයේ භූ-ආර්ථික ඛණ්ඩනයක් සිදුවෙමින් පවතින අවිනිශ්චිත අවධියක ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත්වීම සිදුවෙමින් පවතින බවට අනතුරු ඇඟවීය. පරිවර්තනීය වර්ධනයක් සඳහා යතුර වන්නේ IMF වැඩසටහනෙන් ඔබ්බට ගිය දැක්මක් සහිත, ශ්‍රී ලංකාව තුළම වර්ධනය ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණන් යළි පණගැන්වීම බව ඔහු අවධාරණය කළේය. මෙරට ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයෙන් සාර්ථකව බේරෙමින් සිටියද, ශ්‍රී ලංකාවේ ආර්ථිකය පවතින්නේ බිඳෙන සුළු තත්ත්වයක බවට අනතුරු අඟවන ඔහු, මුළුමනින්ම යථා තත්ත්වයට පත්වීමක් ඉල්ලා සිටන ශ්‍රීලංකාවට, ඒ සඳහා දිගුකාලීන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් සහිත සම්මුතියකට එළැඹිය යුතුව ඇති බව ද අවධාරණය

කළේය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය යළි යථා තත්ත්වට පත්කරගැනීමට ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇති බව පැවසූ ඔහු, එහිදී "අපගේ ජාතික අවශ්‍යතා සහ ආර්ථික ආරක්ෂාව සම්බන්ධයෙන් අතිශය අවධානයෙන් සිටිය යුතුවීමේ අවශ්‍යතාවය ද" ඇඩිව අවධාරණය කළේය.

ලංකා වාණිජ මණ්ඩලයේ සභාපති දුමින්ද හුලංගමුව මහතා සඳහන් කළේ, රටේ මූල්‍ය ශ්‍රේණිගත කිරීම් ඉහළ යාම ශ්‍රී ලංකාවේ ජනතාවට වාසිදායක බලපෑමක් ඇති කරන ආර්ථිකය කෙරෙහි වඩාත් ධනාත්මක දැක්මක් ඇති කරන කරුණක් වන බවයි. ශ්‍රී ලංකාවේ ආර්ථිකය බලගැන්වීමට විශාලතම දායකත්වය සැපයන්නේ ඇනහිට ඇති ද්විපාර්ශ්වික ව්‍යාපෘති නැවත පණ ගැන්වීමෙන් බවත්, එමඟින් වෙළඳපොළේ මුදල් සංසරණය වැඩි වන බවත් ඔහු පැවසීය. නැව්ගතකිරීමේ සහ සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාවේ විභවයන් ප්‍රයෝජනයට ගැනීම, සංචාරක ව්‍යාපාරයේ යටිතල පහසුකම් සඳහා වැඩි ආයෝජන සිදුකිරීම, තොරතුරු තාක්ෂණ සහ BPO ක්ෂේත්‍රය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම ආර්ථික වර්ධනය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් කිරීමට දායක වනු ඇතැයි ද ඔහු යෝජනා කළේය. ලංකා වාණිජ මණ්ඩලය මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද 'විෂන් 2030' ප්‍රතිපත්ති ලේඛනයේ දක්වා ඇති ප්‍රතිපත්ති නිර්දේශ පිළිබඳව රජය සහ විපක්ෂයේ පක්ෂ සමඟ සාකච්ඡා කරමින් සිටින බවත්, එයින් ඉදිරි ගමන පිළිබඳ ආර්ථික සම්මුතියක් ඇති කර ගැනීමට සහයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බවත් ඔහු සඳහන් කළේය.

ලෝක ආර්ථික සංසදයේ ජ්‍යෙෂ්ඨ සාමාජික තලාල් රාෆි, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, 2029 වන විට තිරසාර ආර්ථිකයක් නිර්මාණය කරගැනීම සඳහා තීරණාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැගීමට අවශ්‍ය ශක්තිය ලබා ගැනීම සඳහා ලද අවකාශයක් ලෙස සැලකිය යුතු බව පැවැසීය. ඉන්දියාව සහ තායිලන්තය ආර්ථික ප්‍රතිසංස්කරයෙන් සාර්ථක වූ ආකාරයට සාර්ථක වීමට නම් ශ්‍රී ලංකාව සිය ගැටලු නිවැරැදිව හඳුනාගෙන අනෙකුත් රාජ්‍යයන්ගේ සහයෝගය මත විශ්වාසය තබා කටයුතු කළ යුතු බව ඔහු පැහැදිලි කළේය.

වෙරිටේ රිසර්ච් හි පර්යේෂණ අධ්‍යක්ෂිකා සුභාෂිණී අබේසිංහ පැවසුවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසානය නොවන බවත්, එය ඇත්ත වශයෙන්ම ආරම්භය බවත්ය. මීට පෙර ද ප්‍රතිසංස්කරණ සඳහා බොහෝ උත්සාහයන් ගෙන ඇතත්, පුද්ගල ප්‍රතිලාභ අපේක්ෂාව, දූෂණය සහ පාලනයේ දුර්වලතා යනාදිය එහිදී ප්‍රගතියට බාධාවක් වී ඇති බව සඳහන් කළාය. ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවස්ථාව ලැබී ඇති මෙම කාලයේ දී ශ්‍රී ලංකාව මෙකී බාධක ඉවත් කරගැනීමට කටයුතු කළ යුතු බවත් එසේ නොවුවහොත් ආර්ථික ප්‍රතිසංස්කරණ සාර්ථක නොවනු ඇති බවත් ඇය වැඩිදුරටත් සඳහන් කළා ය. පාලනයේ ප්‍රතිසංස්කරණයකින් තොරව ආර්ථික ප්‍රතිසංස්කරණ සාර්ථක විය නොහැකි බවත්, ශ්‍රී ලංකාව අපේක්ෂා කරන වර්ධනය ළඟා කර ගැනීමට යටිතල පහසුකම් සංවර්ධනය පමණක් ප්‍රමාණවත් නොවන බවත්, ආයතනික හා නියාමන ප්‍රතිසංස්කරණ ද ඉතා වැදගත් බවත් ඇය අවධාරණය කළාය. විශේෂයෙන්ම ජාත්‍යන්තර හැකියාවන් සහ ආයෝජන අවශ්‍ය වන අවස්ථාවක විදේශ ආයෝජන කෙරෙහි ආකල්පමය වෙනසක් ඇති කරගත යුතුව ඇතැයි අවධාරය කළ ඇය, ලෝකය තමන්ට තර්ජනයක් ලෙස දැකීම වෙනුවට විදෙස් හවුල්කාරිත්වය තුළින් ලැබිය හැකි අවස්ථා ලබා ගත යුතු බවත් සඳහන් කළාය.

අනතුරුව පැවති ප්‍රශ්නෝත්තර සැසිය අවධානය යොමු කළ කරුණු අතර, යෝජිත ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පත බලාත්මක කිරීම මඟින් ඇති විය හැකි වෙනස් වීම් පිළබඳ අපේක්ෂා, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ඇතුළු ලාභ නොලබන දැනට පවතින රජය සතු ව්‍යවසාය (SOEs) ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාවය, IMF පාලන රෝග විනිශ්චය තක්සේරුවට අනුකූලව ප්‍රසම්පාදනය කිරීමේදී සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේදී විනිවිදභාවයෙන් යුත් පැහැදිලි දිගුකාලීන FDI මාර්ග සිතියමක් සහ සම තත්ත්වයෙන් කටයුතු කළ හැකි පසුබිමක අවශ්‍යතාවය, සහ එහි තිරසාර බව සහතික කිරීම සඳහා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිර්-දේශපාලනික කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරිණි. එසේම ආර්ථික අර්බුදයෙන් පසු දරිද්‍රතා මට්ටම දෙගුණ වී තිබීම, සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වන වියදම් වැඩි කිරීමේ

අවශ්‍යතාවය සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය වේගවත් කිරීම පිළිබඳව ද එහිදී සාකච්ඡා කෙරිණි.

විවිධ කාල රාමු තුළ විවිධ බාහිර පාර්ශ්වයන් විසින් සුවිශේෂත්වයන් අපේක්ෂා කළ සන්දර්භය තුළ, ශ්‍රී ලංකාව මධ්‍යස්ථ තත්ත්වයක් පවත්වාගෙන යාමේ වැදගත්කම සහ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ විදේශ ප්‍රතිපත්ති පවත්වාගෙනයාමේ දී ස්ථාවරව කටයුතු කිරීමේ වැදගත්කම අවධාරණය කෙරිණි. මෙම සාකච්ඡාවට සහභාගී වෙමින් දකුණු කොරියාව, යුරෝපා සංගමය සහ කැනඩාව ඇතුළු විදේශ දූත මණ්ඩල නියෝජිතයින් ද යෝජිත ප්‍රතිසංස්කරණ, ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා තම අඛණ්ඩ සහයෝගය සහ කැපවීම ඇති බව ප්‍රකාශ කළ අතරම, මෙම සංවාදය පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් ද බෙදාහදා ගත්හ.

24 Horton Place, Colombo 7, Sri Lanka
Tel: +94 11 5363501-2 Fax: +94 11 536 3504 Web: www.lki.lk Email: programmes@lki.lk